# මොනරාගල ප්‍රාදේශීය සභාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජූලි 05 දිනද ,ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 නොවැම්බර් 14 දින සභාවේ සභාපති වරයා වෙත යවන ලදී.

### 1.2 මතය

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරිමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.**

(අ) ඉකුත් වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලැබුණු රූපවාහිනි යන්ත්‍රයක , සමාලෝචිත වර්ෂයේදී ලැබී ඇති ලීටර් 4000 ජල බවුසරයක සහ ලීටර් 2000 ප්ලාස්ටික් ජල ටැංකි 05 ක වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම් රු.1,815,583 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.4,123,725 ක් ලෙස රු.2,308,142 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.99,083 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

#### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 04 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 21,553,390 ක් වු අතර උපයෝගී ලේඛන අනුව ශේෂය රු. 9,281,067 ක් විය.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.75,191,927 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,995,628 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,386,376 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) | වරිපනම් හා බදු | 2,878 | 1,776 | 1,102 |
| (ii) | බදු කුලී | 9,147 | 9,595 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 600 | 496 | - |
| (iv) | වෙනත් ආදායම් | - | - | - |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 99,083 |

(ii) මුද්දර ගාස්තු 2,715,140

## 2.2.3 කඩ කාමර කුලී

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 136 වගන්තිය ප්‍රකාරව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් විධිමත් පරිදි කුලිය තක්සේරු කර ගැනීමට කටයුතු නොකර සභාවේ අනුමැතිය මත පමණක් කුලිය තීරණය කර 1999 සිට 2012 දක්වා කාලය තුල කඩ කාමර 117 ක් බදු දී තිබුන අතර 2012 ජූලි 25 වන විටද කුලිය තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට නව බස් නැවතුම්පල කඩ කාමර 75 න් රු.1,801,610 ක්ද පොදු වෙළඳපල කඩ කාමර 25 න් රු.365,756 ක්ද ,අංක 24 දරන ගව මස් කඩයෙන් රු.178,613 ක්ද හිඟ බදු මුදල් අයවීමට තිබුණි.

(ඇ) 1999 - 2004 දක්වා වු කාලය කුල බදු දෙන ලද නව බස් නැවතුම්පල වෙළඳ සංකීර්ණයේ කඩකාමර 21 න් රු.4,339,649 ක හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) නව බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ අංක 01,02,05,11,12 හා 16 යන කඩ කාමර විධිමත් ටෙන්ඩර් පරිපාටියක් අනුගමනය නොකර බදු දී තිබුණි.

## 2.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවු ගනුදෙනු

(අ) 2006 අප්‍රේල් 10 , 2006 මැයි 26, 2006 අගෝස්තු 01 හා 2007 අගෝස්තු 01 දිනැති පිළිවෙලින් අංක 28, 28 (i), 28 (ii) හා අංක 36 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛවලට හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1) (i) වගන්තිය ප්‍රකාර පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතියක් නොමැතිව සේවකයන් 40 දෙනෙකු බඳවාගෙන වැටුප් ගෙවා තිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ විධිමත් අනුමැතියක් නොමැතිව අනුමත කාර්ය මණ්ඩලයට අතිරික්තව සේවයේ යොදවා ගත් සේවකයින් තිදෙනෙක් සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කර නොතිබු අතර ඔවුන් වෙනුවෙන් 2010 හා 2011 වර්ෂයන්හිදි වැටුප් හා දීමනා සඳහා සභා අරමුදලින් රු.907,122 ක් ගෙවා තිබුණි.

## 2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) 2004 වර්ෂයේදී සභාව සතු පුස්තකාල ගොඩනැගිල්ල කඩා ඉවත් කර තිබූ අතර 2012 ජනවාරි මාසය වන තෙක් නව ගොඩනැගිල්ලක් ඉදිකර නොතිබුණි. මේ සඳහා වෙනත් ස්ථානයක් කුලියට ගෙන ප්‍රාදේශීය ලේකම්ගේ තක්සේරු වාර්තාවන් පදනම් කරගෙන වසර 8 ක් තුළ කුලී වෙනුවෙන් රු.578,000 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ආ) 2008 වර්ෂයේ උපමානපාදක ප්‍රදාන වැඩ සටහන යටතේ මිලදී ගෙන තිබුණ ප්ලාස්ටික් පුටු 118 කින් පුටු 62 ක් ප්‍රතිලාභීන්ට බෙදා නොහැර 2012 මාර්තු 31 දින වන විටද ගබඩාවේ තිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.117,316 ක් වටිනා චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.2,700,218 ක් විය.

(ඉ) ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 36 දෙනෙකුගෙන් අයවිය යුතු රු.588,132 ක ණය ශේෂයන් පියවා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබූ අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් ලබාගත හැකි පරිදි ලේඛන පවත්වා නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.23,715,232 ක් වූ හිඟ ආදායම් අයකර ගෙන නොතිබුණි.

(උ) මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක් අක්‍රීයව පවතින අතර 2011 දෙසැම්බර් 31 දින ශේෂය රු.31,075 ක් විය.

(ඌ) 2011දෙසැම්බර් 31 දිනට අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබුණ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 24,965,247 ක් විය.

(එ) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ රු.44,527 ක් වටිනා චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 (ඈ) පරිදි කටයුතු කර නොතිබුණි.

(ඒ) එක් එක් වර්ෂය අවසානයේදී 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 203 මඟින් විධිවිධාන සලසා ඇති ආකාරයේ සමීක්ෂණ මණ්ඩලයක් විසින් ගබඩා ද්‍රව්‍ය පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබුණි.

(ඔ) 2000 වර්ෂයේ සිට 2010 දක්වා කාලය තුළ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායක මුදල් ගෙවීම ප්‍රමාද කිරීම නිසා රු. 11,943 ක මුදලක් අධිභාර ලෙස ගෙවා තිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර පාලනය

(ආ) ආදායම් පරිපාලනය